# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/Grade II Promo | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.03.28 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>දීප ව්‍යාප්ත සේවාවන්හි II ශ්‍රේණියට උසස් වීම් ලබන නිලධාරීන් වෙත ශ්‍රේණි උසස්වීම් අනුව තනතුරු නාමය වෙනස් කිරීම</u>

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත පරිපාලන බලතල පවරා ඇති සියලුම දීප ව්‍යාප්ත සේවාවන්හි II ශ්‍රේණියට උසස් වීම් ලබන නිලධාරීන් වෙත ශ්‍රේණි උසස්වීම අනුව තනතුරු නාමය වෙනස් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කර ඇති බව එම කොමිෂන් සභා ලේකම්ගේ අංක: PSC/EST/05-05/01/2018 හා 2022.02.07 දිනැති ලිපිය මගින් දන්වා ඇති බව කාරුණිකව දන්වමි.

I. අදාළ තනතුරු III හා II ශ්‍රේණිවල ඒකාබද්ධ තනතුරක් ලෙස සහ තනතුර දරනු ලබන නිලධාරීයා අයත් ශ්‍රේණිය අනුව තනතුරු නාමය සංශෝධනය වන පරිදි අනුමත කර ඇත්නම්, ශ්‍රේණි උසස්වීම අනුව තනතුරු නාමය වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු එම නිලධාරීන්ගේ සේවා ස්ථානයන්හි ආයතන ප්‍රධානීන් විසින් සිදු කරන ලෙසට

II. එලෙස තනතුරු නාමය වෙනස් කරනු ලබන අවස්ථාවලදී, නිලධාරියා අඛණ්ඩව අදාළ තනතුරේ සේවය කර ඇත්නම් II ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනය හෝ තනතුරට පත්වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරු නාමය සංශෝධනය කිරීමට

02. ඉහත පරිදි තනතුරු නාමය වෙනස් කිරීමෙන් අනතුරුව නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුව යාවත්කාලීන කිරීම සඳහා අදාළ තොරතුරු කඩිනමින් මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>வெப்தளம்<br>Website | www.pubad.gov.lk |

03. තවද අධිසේවක පදනම මත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත සඳහන් තීරණය අදාළ නොවන අතර එම නිලධාරීන් සම්බන්ධයෙන් මෙතෙක් පැවති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ තවදුරටත් නොවෙනස්ව පවතින බව වැඩිදුරටත් සඳහන් කරමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය